# පොල් පැළයක් සිටුවීම



- **පොල් වවන්න හොඳම ඉඩම තෝරමු**
    - හොඳින් හිරු එළිය ලැබෙන ඉඩමක් වීම
    - පරිසර උෂ්ණත්වය 27 ˚ c -30 ˚ c
    - 1500mm ට වඩා වැඩි වර්ෂය පුරා පැතිරුණු වර්ෂාපතනය
    - පස -
        - ✓ සැහැල්ලු, ගැඹුරු, තෙතමනය සහිත පසක් සුදුසුය
        - ✓ පසේ ගැඹුර අඩු නම්,
        - ✓ වතුර බැසයන්නේ නැති නම්,
        - ✓ මැටි අධික පසක් නම්, පොල් වගාවට නුසුදුසුය
- **පොල් වවන කාලය**
    - (තෙත් සහ අතරමැදි කලාපය) - අප්‍රේල් සිට ජූලි සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා
    - (වියලි කලාපය) - සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා

- **එලබර පොල් වර්ග**
    - කුඩා ගෙවත්තට - මිටි වර්ග

      **DT, කප්රුවන, කප්සෙත, කප්සුවය**

    - වයස 3- 4ත් අතර කාලයේදී ගෙඩි
    - හොඳ අස්වැන්න
    - හොඳින් රැකබලා ගතයුතුය

    - *ලොකු ඉඩමට - උස වර්ග*

      **TT, PP, මොරොක් උස, සී.ආර්.අයි.එස්.එල් 98**

    - වයස අවු: 5 – 6කින් ගෙඩි
    - නියඟයට හොඳයි
    - අවුරුදු 5න් පීදෙයි

- **හොඳ පොල් පැළයක් තෝරාගමු.**
    - පත්‍ර දාර තියුණු වීම හා උත්තල වීම. (කොළය ඉහළට එසවී තිබීම)
    - රෝග හා පලිබෝධ නොමැති වීම.
    - මාස 7ක් ඉක්මවූ වැඩුණු පැළ
    - මහත කඳකින් යුක්ත වීම හා තද කොළ පැහැති අතු වීම

- ඉඩමට අවශ්‍ය පැළ ගණන

    - නිර්දේශිත ප්‍රමාණය
    - ✓ අක්කරයකට පැළ 64
    - ✓ හෙක්ටාරයකට පැළ 158

    - වගා ක්‍රමය
        - ✓ සමචතුරශ්‍රාකාර ක්‍රමය

| පැළ අතර පරතරය | | පැළ සංඛ්‍යාව | |
|---|---|---|---|
| මීටර | අඩි | හෙක්ටයාරයකට | අක්කරයකට |
| **8.0 * 8.0** | **26 * 26** | **158** | **64** |

- ඉඩමට ගැලපෙන වගාව
    - ✓ ඉඩමේ පොල් වගාවක් නොමැති නම් - නව වගාව ලෙස
    - ✓ ඉඩමේ පැරණි වගාවක් පවතී නම් - නැවත වගාව ලෙස
    - ✓ ඉඩමේ පැරණි වගාවක් පවතී නම් - යටි වගාව ලෙස
    - ✓ පොල් ඉඩමේ තවත් ඉඩ තිබේ නම් - පාළු පැළ සිටුවීම

- පැළය සිටුවිය යුතු ආකාරය
    - ✓ වැලි සහිත ලෝම පසක නම් අඩි 3 * 3 * 3ක වලක්
    - ✓ බොරළු/ කබොක් සහිත ඉඩමක නම් අඩි 4 * 4 * 4 ක වලක් විය යුතුය
    - ✓ පොල් වල කැපීමේදී අඩි 01ක් ගැඹුරු මතුපිට පස් වෙනමද, ඉතිරි යටි පස තවත් පසෙකින් තබන්න
    - ✓ වලෙහි පතුලට පොල් ලෙලි තට්ටුවක් යොදා , එය වැසී යන තෙක් මතුපිට පස් තුනී තට්ටුවක් යොදන්න
    - ✓ එය මතුපිටින් තවත් පොල් ලෙලි තට්ටුවක් යොදන්න
    - ✓ පොල් ලෙලි දැමීමේදී කොහු පැත්ත ඉහලට යොදන්න
    - ✓ වලෙහි ඉතිරි කොටස පුරවා ගැනීමට ගැඹුරු පස් මිශ්‍රණය සාදාගන්න
    - ✓ ගැඹුරු පස සමඟ මිශ්‍ර කරන්න
    - ✓ කාබනික පොහොර -10kg
    - ✓ ඩොලමයිට් - 01kg
    - ✓ පැළ පොල් පොහොර මිශ්‍රණය-1kg
    - ✓ මෙම මිශ්‍රණයෙන් වල පුරවා ගන්න.
    - ✓ පොළව මට්ටමේ සිට අඟල් 09ක් ඉතිරි වන සේ වල පුරවා ගන්න




පොල් පැළය සිටුවීමට සකස්කල පොල් වලක හරස්කඩ

- **පොලව මට්ටමේ සිට අඟල් 9ක් ඉතිරි වන සේ වල පුරවා ගන්න.**

✓ පැළය සිටුවීමට පෙර පැළයට වේ නාශකය යොදන්න
✓ පැළය වලෙහි ගැඹුරින් සිටුවීම නොකල යුතුය
✓ පොල් පැළය වටා පොල් ලෙලි/ පොල් අතු/ වියළි තණකොළ වසුන් ලෙස යොදන්න
✓ මෙම පැළයට දිනකට වතුර බාල්දි 2ක් පමණ අවශ්‍ය වේ (ලීටර් 12ක්)
✓ වර්ෂාව නොමැති නම් දිනපතා වතුර යොදන්න
✓ සතියකට දෙසැරයක් වතුර දාන්න

- **සිටුවන කාල සීමාව**
  ✓ පැළ සිටුවීම වර්ෂා කාලය එළඹීම සමග කරන්න
  ✓ වතුර රඳන ඉඩම්වල වර්ෂා කාලය අවසානයේ පැළය සිටුවන්න

- **පොල් පැළ සිටුවීමෙන් පසු…….**
  ✓ පැළ සිටුවා මාස 6 කට වරක් පීදෙන තෙක් පොහොර යොදන්න
  ✓ පැළ වලට යොදන රසායනික මිශ්‍ර පොහොර YPM ලෙස හැඳින්වේ
    - **තෙත් හා අතරමැදි කලාපය-** YPM-W 1250g
    - ඩොලමයිට් 1Kg
    - **වියළි කලාපය -** YPM –D 850g
    - ඩොලමයිට් 1Kg

- ✓ මෙයට අමතරව ගොම පොහොර, එළු පොහොර හෝ පදම් කළ කුකුල් පොහොර කිලෝ ග්‍රෑම් 10 ක් පැලය සිටුවන වලට දාන්න.
- ✓ පොහොර යොදන ප්‍රදේශය පොහොර කවය වේ
- ✓ පොල පැලයක පොහොර කවයේ අරය පැලයේ වයස සමඟ වැඩිවේ

| පැලයේ වයස | පොහොර කවයේ අරය |
|---|---|
| මාස - 06 | අඩි 01 |
| වසර - 01 | අඩි 02 |
| වසර - 02 | අඩි 03 |
| වසර - 03 | අඩි 04 |
| වසර 04 සිට ඵල දරණ තෙක් | අඩි 05 |